සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

33 S I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : ........................................ ඉතිහාසය - I කාලය : පැය 01 යි.

සැළකිය යුතුයි:-

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ කතිර (✗) ලකුණ යොදන්න.

01. අතීත ප්‍රජාව විසින් විවිධ කාලවකවානුවල ලියන ලද ග්‍රන්ථ හෝ ලේඛන අයත්වන්නේ කුමන මූලාශ්‍ර වර්ගයට ද?
1. සාහිත්‍ය මූලාශ්‍ර 2. පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර
3. ඝානක මූලාශ්‍ර 4. පුරාවස්තු

02. පුනරුක්ති දෝෂ බහුලව පවතින ඓතිහාසික කරුණු කෙටියෙන් දක්වා ඇති මෙරට ඉතිහාසය ලියවී ඇති පැරණිම සාහිත්‍ය මූලාශ්‍රය කුමක් ද?
1. මහා වංශය 2. දීප වංශය 3. ථූප වංශය 4. රසවාහිනිය

03. පාලියෙන් ලියවුන මහාවංශයේ මුල් කොටස අර්ථ විවරණය කර ගැනීම සඳහා ලියවුන මහා වංශ ටීකාව ලියවුනේ මුල් කොටස ලියවී ශත වර්ෂ කොපමණ කාලයකට පසුව ද?
1. ශත වර්ෂ 4 ට පසු 2. ශත වර්ෂ 3 ට පසු
3. ශත වර්ෂ 2 ට පසු 4. ශත වර්ෂ 5 ට පසු

04. A ඇරිස්ටෝටල්ගේ ඩිමුන්ඩෝ කෘතිය
B ප්ලිනිගේ නැචුරාලිස් හිස්ටෝරියා කෘතිය
C ඉබන් බතූතාගේ දේශාටන වාර්තා
D පර්නාඕ ක්වේරෝස් පියතුමාගේ ලංකාව පිළිබඳ විස්තරය
ඉහත සඳහන් වන්නේ ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් වන විදේශීය මූලාශ්‍ර කිහිපයකි. එම මූලාශ්‍ර අයත් රටවල් අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. රෝමය, ග්‍රීසිය, පෘතුගාලය, අරාබිය 2. ග්‍රීසිය, අරාබිය, රෝමය, පෘතුගාලය
3. පෘතුගාලය, රෝමය, ග්‍රීසිය, අරාබිය 4. ග්‍රීසිය, රෝමය, අරාබිය, පෘතුගාලය

05. පහත සඳහන් විදේශීය මූලාශ්‍ර රචිත කතුවරු අතරින් මෙරටට පැමිණ මෙහි ඇති තතු දැකබලා වාර්තා තැබූ වාර්තා කරුවෙක් තෝරන්න.
1. පිලිප්පස් බැල්දියස්ගේ ලංකා පුරාවෘත්තය 2. පර්නාඕ ක්වේරෝස් පියතුමාගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථ
3. ප්ලිනිගේ නැචුරාලිස් හිස්ටෝරියා 4. හියුංසියැංගේ වාර්තා

06. පහත සඳහන් කාසි අතරින් මෙරටින් හමුවුනු පැරණිම කාසිය කුමක්දැයි තෝරන්න.
1. ඇතා හා ස්වස්තික කාසිය 2. කහාපණ කාසිය
3. තඹ මස්ස 4. ලක්ෂ්මී කාසිය

07. පහත දැක්වෙන අභිලේඛන ඒවා ලියා ඇති මාධ්‍ය අනුව 'අ' තීරුවේ තොරතුරු 'ආ' තීරුව සමඟ ගැලපූ විට නිවැරදි පිළිතුර පහත පිළිතුරු අතරින් තෝරන්න.

| (අ) | | (ආ) | |
|---|---|---|---|
| 1. | ගල් වල | A | වල්ලිපුරම් |
| 2. | බිත්ති වල | B | ඇම්බැක්කේ දැව කණුවල ලේඛන |
| 3. | දැව වල | C | ගල්පොත ලිපිය |
| 4. | රන් තහඩුවල | D | සීගිරි ගී |

1. B C A D 2. C D B A 3. B A D C 4. C B A D

08. පහත 'අ' තීරුවේ සඳහන් තොරතුරු 'ආ' තීරුවේ තොරතුරු හා ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| (අ) | | (ආ) |
|---|---|---|
| ප්ලිනිගේ නැචුරාලිස් හිස්ටෝරියා | A | ග්‍රීක මූලාශ්‍ර |
| පර්නාඕ ක්වේරෝස් පියතුමා | B | රෝම මූලාශ්‍ර |
| හියුංසෑංගේ දේශාටන වාර්තා | C | පෘතුගීසි මූලාශ්‍ර |
| මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා | D | චීන මූලාශ්‍ර |
| | E | ඕලන්ද මූලාශ්‍ර |

1. B F C E    2. B C D A    3. A D C B    4. D C B A

09. පින්තූරයේ දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ භාවිතා වූ කාසියකි. මෙය හඳුන්වන නම කුමක් ද?



1. අක නම් රන් කාසිය
2. මධ්‍යකාලීන රන් කහවනුව
3. ධරණ කාසිය
4. තඹ මස්ස

10. මූලාශ්‍ර ඇසුරින් තොරතුරු ලබාගෙන ඉතිහාසය ගොඩනැගීමේ දී අතීතය නිවැරදිව දැකීමට නම් එම මූලාශ්‍ර පරිශීලනය කළ යුත්තේ කෙසේද?

1. විචාර බුද්ධියෙන්    2. කටපාඩම් කර
3. ලේඛනගත කිරීමෙන්    4. ඉතිහාසය පිළිබඳ ඇල්මකින්

11. සාහිත්‍ය මූලාශ්‍රයක් ලෙස නිකාය සංග්‍රහය වැදගත් වන්නේ මෙරටේ කුමන තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් ද?

1. ආර්ථික තොරතුරු    2. දේශපාලන තොරතුරු
3. ශාසන ඉතිහාසය පිළිබඳ තොරතුරු    4. අධ්‍යාපනය පිළිබඳ තොරතුරු


12. මැටි පුවරු, බිත්ති, තඹ තහඩු, දැව ආදී විවිධ ද්‍රව්‍යවල ලියූ ලේඛන හැඳින්වීමට පොදුවේ භාවිත වන නම කුමක් ද?

1. අභිලේඛන    2. බ්‍රාහ්මීය ලිපි    3. ගිරි ලිපි    4. පුවරු ලිපි

13. පැරකුම්බා සිරිත නම් කෘතිය කුමන වර්ගයේ මූලාශ්‍රයක් ද?

1. හටන් කාව්‍යය කි.    2. සංදේශ කාව්‍යය කි.    3. ප්‍රශස්ති කාව්‍යය කි.    4. වීර කාව්‍යය කි.

14. සිතියම ඇසුරින් පහතරට වියළි කලාපය සහ පහත රට අතරමැද වියළි කලාපය දක්වා ඇති අක්ෂර දෙක වනුයේ කුමක් ද?




1. F හා B ය.    2. B හා C ය.
3. C හා D ය.    4. D හා E ය.

15. මෙරට ගල් යුගයේ මිනිසා ජීවත් වූ පාරිසරික කලාප තීරණය කිරීමට ප්‍රධාන වශයෙන් බලපෑවේ කුමන භෞතික සාධක ද?

1. පසෙහි ස්වභාවය    2. දේශගුණය
3. වාර්ෂික වර්ෂාපතන අගය    4. භූ විෂමතාව

16. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ කඳුකර එළිමහන් දඩයම් වාසස්ථාන 2ක් අයත් පිළිතුර තෝරන්න.

1. මිනිහාගල් කන්ද, බුන්දල    2. බණ්ඩාරවෙල, හෝර්ටන්තැන්න
3. සීගිරියේ පොතාන, අලිගල    4. පාහියන්ගල, බටදොඔලෙන

17. තම ඥාතියෙකු මිය ගිය පසු තමන් වාසය කළ ගල් ගුහාව තුළ ම වැළලීම සිරිතක් පැවතියේ කුමන යුගයේ වාසය කළ ජනතාව තුළ ද?

1. ගල් යුගයේ    2. මුල් ඓතිහාසික යුගයේ
3. පූර්ව ඓතිහාසික යුගයේ    4. ගොවි යුගයේ

18. ගල් යුගයේ තාක්ෂණය පිළිබඳ විස්තරාත්මක දැනුමක් ලබා ගැනීමට හැකි වන්නේ එම යුගයේ භාවිත කළ කුමන මෙවලම් වලින් ද?

1. ඇඹරුම් ගල්    2. ගල් මිටිය    3. ක්ෂුද්‍ර ශිලා මෙවලම්    4. පබළු

19. මෙරට ගල් යුගයේ ජනතාව මෙරට වැදි ජනතාවට සමානකම් දක්වූයේ කුමන කරුණු සම්බන්ධයෙන් ද?

1. ආර්ථික හා සාමාජික වශයෙන්
2. සංස්කෘතික හා ජීව විද්‍යාත්මක වශයෙන්
3. ආගමික හා සංස්කෘතික වශයෙන්
4. දේශපාලනික හා සංස්කෘතික වශයෙන්

20.
- පිළිස්සූ මැටි වළං භාවිතය
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර අනුගමනය කිරීම
- ගල් මෙවලම් වෙනුවට යකඩ ලෝහය භාවිත කිරීම
- ස්ථිර ජනාවාස පිහිටුවීම

ඉහත වෙනස්කම් සිදු වූයේ ශ්‍රී ලංකාව ජනාවාස වීම සම්බන්ධ කුමන යුග පරිවර්තනයකදී ද?

1. ප්‍රාග් ඓතිහාසික යුගය, මුල් ඓතිහාසික යුගය දක්වා වෙනස්කම් වලදී
2. පූර්ව ඓතිහාසික යුගය, මුල් ඓතිහාසික යුගය දක්වා වෙනස්කම් වලදී
3. ප්‍රාග් ඓතිහාසික යුගය පූර්ව ඓතිහාසික යුගය දක්වා වෙනස්කම් වලදී
4. මුල් ඓතිහාසික යුගය නූතන යුගය දක්වා වෙනස්කම් වලදී

21. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය හැදෑරීමට ඇති හොඳම සාක්ෂිය වන්නේ මින් කුමක් ද?

1. මහා ශිලා සුසාන
2. රත්නපුර අවට ඇති දියලු පස් තට්ටු
3. ගල්ලෙන් වාසස්ථාන
4. භාවිත කළ ඇඳුම් පැළඳුම්

22. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ ජීවන රටාව පිළිබඳ යම් තරමක හෝ අදහසක් ලබා ගැනීමට හැකි ස්ථානයක් ලෙස කැනීම් කර හෙළිදරව් කරගෙන ඇත්තේ,

1. ඉබ්බන්කටුවෙන් කළ කැනීම්වලින්
2. බෙරගල ප්‍රදේශ වල කළ කැනීම් වලින්
3. පොතාන ගල් ගුහාවේ කළ කැනීම් වලින්
4. උඩරංචාමඩම නේවාසික ස්ථානයේ කැනීම් වලින්.

23. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස බිහිවූයේ කුමන ස්ථාන මූලික කරගෙන ද?

1. ගංගාවක් මුල් කරගෙනය.
2. වැවක් මුල්කරගෙනය.
3. කඳුගැටයක් මුල්කරගෙනය.
4. නිම්න ප්‍රදේශයක් මුල්කරගෙන ය.

24. මුල් ඓතිහාසික යුගයේ ධීවරයන් විසූ ගම් හැඳින්වූයේ කුමන නමින් ද?

1. වඩ්ඪකී ගාම නමිනි
2. කේවට්ය ගාම නමිනි.
3. පට්ටන ගාම නමිනි.
4. කුම්භකාර ගාම නමිනි.

25. මුල් ඓතිහාසික යුගයේ ගමක ගෘහපතියන් කීප දෙනෙකුගෙන් සැදුම්ලත් කණ්ඩායමක් වෙනුවෙන් කටයුතු කළ පුද්ගලයා හැඳින්වූයේ කුමන නමින් ද?

1. පරුමක 2. ගමික 3. ගහපති 4. රාජන්

26. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ගංගා නිම්න තුළට අවතීර්ණ වන ආකාරය පිළිබඳ පැහැදිලිව දක්නට ලැබෙන්නේ කුමන ගංගා නිම්නය ආශ්‍රිතව කළ කැනීම් වලින් ද?

1. ගල් ඔය 2. කිරිඳි ඔය 3. දැදුරු ඔය 4. මල්වතු ඔය


27. ගංගාවක පිටාර නිම්න වලින් පිටත ජනාවාස පිහිටුවා ගැනීමේ දී මුල් ඓතිහාසික යුගයේ ජනතාව ප්‍රධාන ජීවනෝපාය ලෙස තෝරාගත්තේ කුමක් ද?

1. සත්ව පාලනය 2. වී ගොවිතැන 3. හේන් ගොවිතැන 4. වෙළඳාම

28. පරුමකයින්ට ප්‍රාදේශීය බලයක් හිමිව තිබූ බව සඳහන් වන සෙල්ලිපිය කුමක් ද?

1. කොත්ගල්කන්ද සෙල්ලිපිය
2. කළුදිය පොකුණ සෙල්ලිපිය
3. කොරවක්ගල සෙල්ලිපිය
4. පෙරිය පුලියන් කුලම සෙල්ලිපිය.

29. පින්තූරයේ දැක්වෙන්නේ අතීත සමාජයේ සිටි පරුමක වරුන් භාවිතාකරන ලද සුසාන භූමියකි. එය හඳුනාගෙන නම් කරන්න.



1. හල්දුම්මුල්ල සුසාන භූමිය
2. ඉබ්බන්කටුව සුසාන භූමිය
3. ගල්සොහොන් කනත්ත සුසාන භූමිය
4. යටිගල්පොත්ත සුසාන භූමිය.

30. 1. ඇඹුල් අඹේ සෙල්ලිපිය A ගම්කයන්, ගෘහපතියන් අතරින් පත්වීම
2. මහාවංශය B ගම්කගෙන් වී මල්ලක් ණයට ගැනීම.
3. ජාතකට්ඨ කතාව C පණ්ඩුකාභය රජතුමා දසවෙනි රාජ වර්ෂයේ දී ග්‍රාම සීමා ලකුණු කිරීම
4. සමන්ත පාසාදිකාව D පොවනි රජ

ඉහත සඳහන් ප්‍රකාශ නිවැරදිව ගැලපූ විට එන නිවැරදි පිළිතුර තෝරන්න.

1. A D C B 2. D C B A 3. D C A B 4. D M A C

31. දේශපාලන බලය මධ්‍යගත වීමේ දී ජනතාවගේ ශුභසිද්ධිය ගැන අනලස්ව කටයුතු කර ඔවුන් සැම සතුටට පත් කරන්නා හැඳින්වීමට භාවිත කළ නම කුමක් ද?

1. දුහතර රජ 2. රජ 3. මපුරුමුකා 4. ඇමති

32. දඹුලු විහාරයේ පර්වත සෙල්ලිපිය අනුව කුටකණ්ණ අභය රජු තමාව හඳුන්වා ගත් රාජ්‍ය සංකල්පය වූයේ කුමක් ද?

1. පර්වත රාජ 2. බෝධිසත්ව 3. නර ඉසෙර 4. චක්‍රවර්තී

33. පහත සඳහන් ප්‍රකාශවලින් පියාගෙන් පුතාට රජකම උරුම වූ අවස්ථාවක් තෝරන්න.

1. වසභගෙන් පසු වංකනාසික තිස්ස රජුට 2. දේවානම්පියතිස්ස රජුගෙන් පසු ථුල්ලත්ථනට
3. දුටුගැමුණුගෙන් පසු සද්ධාතිස්සට 4. කාශ්‍යපගෙන් පසු මුගලන්ට

34. දේශපාලන බලය විමධ්‍යගත වූ පසු රජුට උදව් කළ නිලධාරීන් අතර පන අදෙක නමින් හැඳින්වූයේ කවු ද?

1. රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී 2. වෙළඳ කටයුතු භාර ප්‍රධානී
3. නාට්‍ය අංශ ප්‍රධානී 4. කාසි අච්චු ගැසීමේ ප්‍රධානී

35. මෙරට ඉතිහාසයේ ප්‍රථම සංවිධානාත්මක සටනට නායකත්වය දෙන ලද්දේ කවුරුන් ද?

1. දේවානම්පියතිස්ස රජු 2. වළගම්බා රජු
3. දුටුගැමුණු රජු 4. ධාතුසේන රජු

36. වසභ රජතුමා කුමන රාජ වංශයක ආරම්භක රජු ලෙස සැලකේ ද?

1. මෞර්යය රාජවංශය 2. මානවම්ම රාජවංශය
3. පාණ්ඩ්‍ය රාජවංශය 4. ලම්භකර්ණ රාජවංශය

37. පහත AB ප්‍රකාශ සලකා බලා පිළිතුරු සපයන්න.

A පළාත් බෙදා පාලනය කිරීම
B මාතොට වරාය විදේශ බලයෙන් මුදවා ගැනීම

මෙම ප්‍රකාශ අතරින් වසභ රජතුමා පිළිබඳ සත්‍ය ප්‍රකාශය තෝරන්න.

1. A සත්‍ය වේ. B අසත්‍ය වේ. 2. A B සත්‍ය වේ.
3. B සත්‍ය වේ A අසත්‍ය වේ. 4. A B දෙකම අසත්‍ය වේ.

38. පහත ප්‍රකාශ අධ්‍යයනය කර 38-39 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A පළමු වරට විශාල ප්‍රමාණයේ වැව් ඉදිකිරීම.
B අන්තර් ජාතික කලාපීය අවශ්‍යතාවලට මුහුණදීමට සාධනීය පියවර ගැනීම.
C රටේ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීමට දායකවීම.
D රාජකීය පවුලට රැකවරණ සැලසූ බුදල්නාවන්ට කළ ගුණ සැලකීම පිණිස පනාකඩුව තඹ සන්නස කරවීම.
E රුවන්වැලි සෑය ඉදිකිරීමට සම්බන්ධ වූ අයට සතර වාසල් දොරටුවේ දන්සල් දීම.

ඉහත ප්‍රකාශවලින් I වන විජයබා රජුට සම්බන්ධ වැදගත් ප්‍රකාශ දෙක වනුයේ

1. A හා B ය. 2. B හා C ය. 3. C හා D ය. 4. D හා E ය.

39. වසභ රජු හා සම්බන්ධ වැදගත් ප්‍රකාශ සම්බන්ධ පිළිතුර කුමක් ද?

1. A හා B ය. 2. B හා E ය. 3. C හා D ය. 4. C හා E ය.

40. I වන විජයබාහු රජු අනුරපුරය වෙනුවට පොළොන්නරුව තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරාගැනීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද?

1. මීට පෙර මෙය යුධ කඳවුරක් ලෙස පැවති නිසා
2. පොළොන්නරුවේ සිට රුහුණෙන් එන අභියෝගවලට මුහුණදීම පහසු නිසා
3. චෝලයන්ට ප්‍රහාර එල්ල කිරීම පහසු නිසා
4. පොළොන්නරුවේ සිට පහසුවෙන් ත්‍රිමලය වරායේ වෙළඳාම පාලනය කළ හැකි නිසා.

40 × 2 = 80

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

33 | S | II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 10 - 2020**

නම/විභාග අංකය : ....................................... ඉතිහාසය - II                    කාලය : පැය 03 යි.

- පළමු කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- දෙවන කොටසෙන් ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6කි.

**I කොටස**

01. (අ) පහත රෝම ඉලක්කම් (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ද (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේ ද ලකුණු කොට නම් කරන්න.

(i) කිරිඳි ඔය, අනුරාධපුරය, කෝට්ටේ, දඹකොළපටුන, ත්‍රිකුණාමලය, පාහියන්ගල, කලා වැව, ඉබ්බන්කටුව, මල්වතු ඔය, සීගිරිය, ඉරණමඩු වැව, මාතලේ (ලකුණු 12)

(ii) අරාබිය, චීනය, පෘතුගාලය, රතු මුහුද, රෝමය, බ්‍රිතාන්‍යය (ලකුණු 06)

(ආ) (i) පහත ABCD යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - මහා වංශයේ මුල් කොටස රචනා කළ මහානාම හිමි වැඩ විසූ පිරිවෙන

B - එදා හෙළදිව නම් කෘතිය රචනා කළ ඉංග්‍රීසි ජාතිකයා

C - ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා යුගයට අයත් ජ්‍යාමිතික මෙවලම් සෑදූ තිරුවානා වර්ගය හඳුන්වන නම

D - වැඩි දෙනාගේ එකඟතාවයෙන් රට පාලනයට පත් කළ පාලකයා හඳුන්වන නම (ලකුණු 04)

(ii) 1. පිංතූරයේ දැක්වෙන භූගෝල විද්‍යාඥයා කවු ද? (ල. 01)

2. ඔහු කුමන ජාතිකයෙක් ද? (ල. 01)

3. ඔහු විසින් නිර්මාණය කරන ලද්දේ කුමන රටක සිතියමක් ද? (ල. 01)

4. ඔහු ජීවත් වූ රට කුමක් ද? (ල. 01)



(iii) 1. පිංතූරයේ දැක්වෙන මූර්තිය කුමක් ද?

2. මූර්තිය ඇති විහාරය කුමක් ද?

3. මෙම නිර්මාණය කළේ කුමන සියවසේ ද?

4. මෙම මූර්තියෙන් නිරූපණය කරන ලද දෙවිවරු දෙදෙනා කවුරුන් ද? (ල. 04)



## II කොටස

02\. (i) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ සාහිත්‍ය මූලාශ්‍රයක් වන මහා වංශය රචනා කිරීමට මූලාශ්‍ර කරගත් කෘති නම් කරන්න. (ල. 03)

(ii) ඉතිහාසය ගොඩනැගීමට මූලාශ්‍ර යොදා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 04ක් නම් කරන්න. (ල. 04)

(iii) ඉතිහාසය හැදෑරීමේදී සාහිත්‍ය මූලාශ්‍රවල ප්‍රයෝජන කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) මෙරට ඉතිහාසය හැදෑරීමේදී භාවිතා කළ හැකි ඝානක මූලාශ්‍ර තුනක් නම්කර එමගින් ලබාගත හැකි ඉතිහාසය පිළිබඳ තොරතුරු පැහැදිලි කරන්න. (ල. 06)

03\. (i) ලංකාව පිළිබඳ රචිත දකුණු ඉන්දියානු දෙමළ ග්‍රන්ථ තුනක් නම් කරන්න. (ල. 03

(ii) රජරට ශිෂ්ටාචාර සමයේ ඉතිහාසය හැදෑරීමට උදව්කරගත හැකි ධර්ම ග්‍රන්ථ හතරක් නම් කරන්න.(ල. 04)

(iii) මෙරට පැරණිම ශිලා ලේඛන වන බ්‍රාහ්මීය සෙල්ලිපි වැදගත් වන්නේ කුමන කරුණු දැනගැනීම සම්බන්ධයෙන්දැයි කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල. 05)

(iv) ක්‍රි. ව. දෙවන සියවසේ ලියන ලද සෙල්ලිපි වැදගත් වන්නේ කුමන කරුණු සම්බන්ධයෙන්දැයි කරුණු තුනක් ඇසුරින් සඳහන් කරන්න. (ල. 06)

04\. (i) අපගේ සංස්කෘතික ඉතිහාසයේ පෙන්නුම් කරන ජීවමාන සාක්ෂි තුනක් නම් කරන්න. (ල. 03)

(ii) පහත ස්ථානවල ලියන ලද අභිලේඛන හැඳින්වීමට යොදන නම් සඳහන් කරන්න. (ල. 04)

A ගල්ලෙන්වල කටාරම අසල කෙටූ ලිපි

B ගල්තලාවල හෝ ගල්කුළු මත ලියූ ලිපි

C සකස් කරගත් ගල්කුළුණු මත ලියූ ලිපි

D මල් ආසන මෙන් තැනූ ගල්පුවරු මත ලියූ ලිපි

(iii) පුරාණ නටබුන් ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රයක් ලෙස වැදගත්වන්නේ ඇයිදැයි කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම කරුණු හතරක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

05\. (i) පහත ABC යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න. (ල. 03)

A ශ්‍රී ලංකාවේ අර්ධ ශුෂ්ක කලාපයේ පොළොවේ මැටි සහිත වැලි පසෙහි හමු වූ බොරළු තට්ටුව හඳුන්වන නම

B මීට වසර 38,000කට පෙර ප්‍රාග් ඓතිහාසික මානවයාගේ වාසස්ථානයක්ව පැවති ස්ථානයක්.

C පහත රට වියළි කලාපීය ලෙනක් (ල. 03)

(ii) පහත A B C D ලෙස දක්වා ඇති තොරතුරුවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A ගල් යුගයේ තාක්ෂණය පිළිබඳ විස්තරාත්මක දැනුමක් ලබා ගැනීමට ඉවහල් වන මෙවලම් හඳුන්වන නම

B ප්‍රාග් ඓතිහාසික යුගයේ අභිචාර විධියක් වූ ඇටසැකිලි නමා වකුටුකර වළදමා තිබූ ගල්ලෙන

C පූර්ව ඓතිහාසික යුගයට අයත් සබරගමු පළාතේ පිහිටි සොහොන් බිම

D පූර්ව ඓතිහාසික යුගයේ බිහිවීමට පසුබිම සකස් කළ දේශගුණික විපර්යාසය සිදු වූ යුගය හඳුන්වන නම

(ක්ෂුද්‍ර ශිලා මෙවලම්, ජ්‍යාමිතික මෙවලම්, කුරුවිට බටදොඹ ලෙන, රංචා මඩම, හොලෝසීන) (ල. 04)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා මිනී වැළලීම සම්බන්ධයෙන් අභිචාර විධීන් කළ ස්ථාන දෙකක් නම් කර එම චාරිත්‍ර කෙබඳු දැයි විස්තර කරන්න. (ල. 05)

(iv) පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්වීමට බල පෑ හේතු සාධක තුනක් නම්කර විස්තර කරන්න. (ල. 06)

06\. (i) පූර්ව ඓතිහාසික යුගයේ යකඩ භාවිත කිරීම නිසා පහසු කරගත් කෘෂිකාර්මික කටයුතු තුනක් නම් කරන්න. (ල. 03)

(ii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක හතරක් නම් කරන්න. (ල. 04)

(iii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස බිහිවූ ස්වරූපයන් දෙකක් නම්කර උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල සංවිධානය හා පරිපාලනය ක්‍රමවත්ව සිදු වූ බව ගහපති හා දස ගම් ඇත්තන් යන කණ්ඩායම් වල ක්‍රියාකාරිත්වය ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

07. (i) පැරණිගම් එකිනෙකට වෙන්ව පැවති ආකාර තුනක් පහත දැක්වේ. ගම් වැසියන් එම වෙන්වීම තේරුම්ගත් ආකාරයන් ඉදිරියෙන් ලියා දක්වන්න. (ල. 03)

A අපේගම -

B අල්ලපුගම -

C පිටගම් -

(ii) ගමිකයන් ඉටුකළ කාර්යන් හතරක් නම් කරන්න. (ල. 04)

(iii) ජාත්‍යන්තර වෙළදාමට සම්බන්ධ වීමේ දී මුළු රටම ඒකීය පාලනයක් ඇති රටක් ලෙස ගොඩනැගීමට දේවානම්පියතිස්ස රජු විසින් කළ කාර්යයන් දෙකක් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) දේශපාලන බලය මධ්‍යගත කිරීමේ ක්‍රියාවලියේදී පණ්ඩුකාභය රජුගෙන් ඉටුවූ කාර්යයන් තුනක් නම්කර විස්තර කරන්න. (ල. 06)

08. (i) දේශපාලන බලය මධ්‍යගත වීමේදී රජවරුන් භාවිතා කළ රාජ්‍යත්ව සංකල්ප තුනක් නම් කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය සිදු වූ ආකාර හතරක් සඳහන් කරන්න.

(iii) දුටුගැමුණු රජතුමා මහරජෙකු ලෙස අභිෂේක ලැබූ පසු ජනතා සුබ සිද්ධිය වෙනුවෙන් කැප වූ ආකාරය උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(iv) වසභ රජතුමා මෙරට අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම සඳහා ගත් පියවර කරුණු තුනක් ඔස්සේ පැහැදිලි කරන්න.

09. (i) දේශපාලන බලය මධ්‍යගත කිරීමේ ක්‍රියාවලියේ දී සකස් වූ රාජ්‍ය පරිපාලන සැකැස්මට අයත් නිලධාරි තන්ත්‍රයේ පහත සඳහන් නිලධාරීන්ට අයත් කාර්ය භාරයන් ලියන්න. (ල. 03)

1. කොතුරුගැනා
2. බතගු
3. නගරවුඩික

(ii) වසභ රජතුමා මෙරට ක්ෂේත්‍රයට කළ සේවා හතරක් නම් කරන්න. (ල. 04)


(iii) පළමුවන විජයබාහු රජතුමා චෝල පාලනයෙන් රට නිදහස් කර ගැනීමට සැලසුම් සහගතව ක්‍රියා කළ ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) I වන විජයබාහු රජතුමා පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීමට බල පෑ හේතු 2ක් නම් කර පැහැදිලි කරන්න. (ල. 06)




01. (අ) (i)
01. (அ) (i)
01. (a) (i)

01. (අ) (i)
01. (அ) (i)
01. (a) (i)



සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

33 S I-II

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 10 - 2020

### ඉතිහාසය - පිළිතුරු පත්‍රය


## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 3 | 21. | 1 | 31. | 2 |
| 02. | 2 | 12. | 1 | 22. | 4 | 32. | 3 |
| 03. | 1 | 13. | 3 | 23. | 2 | 33. | 1 |
| 04. | 4 | 14. | 2 | 24. | 2 | 34. | 2 |
| 05. | 1 | 15. | 3 | 25. | 2 | 35. | 3 |
| 06. | 2 | 16. | 2 | 26. | 2 | 36. | 4 |
| 07. | 2 | 17. | 1 | 27. | 3 | 37. | 1 |
| 08. | 2 | 18. | 3 | 28. | 1 | 38. | 3 |
| 09. | 2 | 19. | 2 | 29. | 2 | 39. | 1 |
| 10. | 1 | 20. | 3 | 30. | 2 | 40. | 4 |

40 × 2 = 80


## II කොටස

(01) (අ) (i) ලංකා සිතියම




(ල. 12)

(ii) ලෝක සිතියම




(ල. 6)

### II කොටස

(ආ) (i) A අනුපුර දික්සඳ සෙනෙවියා පිරිවෙන
B රොබට් නොක්ස්
C බිම් වීදුරු
D මහා සම්මත (ල 4)

(ii) 1. ක්ලෝඩියස් ටොලමි
2. ග්‍රීක රෝමානුවෙක්
3. ශ්‍රී ලංකාවේ
4. ඇලෙක්සැන්ඩ්‍රියාව (ල 4)

(iii) 1. මිනිසා සහ අශ්ව හිස
2. ඉසුරුමුණි විහාරය
3. 7 වන සියවසේ
4. අග්නි හා පර්ජන්‍ය (ල. 4)

## II කොටස

02. (i) 1. සීහලට්ඨ කතා මහා වංශය
2. විනයට්ඨ කතා
3. උත්තර විහාරට්ඨ කතා (ල. 3)

(ii) 1. මූලාශ්‍රය රචනා වූ කාලය
2. මූලාශ්‍රයේ කතුවරයා
3. කතුවරයාගේ අරමුණ
4. මූලාශ්‍රයට කරුණු සපයාගත් ආකාරය
(ල. 4)

(iii) 3. ඓතිහාසික කාල අනුපිළිවෙල දැනගත හැකිවීම.
එක් එක් අවධිවල දේශපාලන ආර්ථික, සමාජීය තොරතුරු දැනගත හැකිවීම.
විදේශ සම්බන්ධතා දැනගත හැකිවීම.
එක් මූලාශ්‍රයක තොරතුරු තවත් මූලාශ්‍රයකින් තහවුරු කරගත හැකිවීම. (ල. 5)

(iv) පුරාණ හෝ ධරණකාසි
ඇතා හා ස්වස්ථික කාසි
ලක්ෂ්මී කාසිය
1. වෙළඳාම ආදී ආර්ථික කටයුතු දැනගැනීම
2. ලෝහ භාවිතය
3. තාක්ෂණය ආදී දේ දැන ගැනීමට හැකිවීම.
(ල. 6)

03. (i) සිලප්පදිකාරම
මණිමේකලෛයි
පදිර්රුප්පත්තු (ල. 3)

(ii) බෝධි වංශය, ථූප වංශය, ධාතු වංශය පූජාවලිය සද්ධර්මාලංකාරය

(iii) පැරණි සමාජ ඉතිහාසය,
ජනාවාස ව්‍යාප්තිය,
භික්ෂූන් වහන්සේලාට ලෙන් පිදීම ආදිය විස්තර කරන්න. (ල. 5)

(iv) විහාර පාලනය පිළිබඳ සඳහන් වීම
ගම්බිම් පිදීම
රජයේ නීති මහජනයාට දැනුම් දීම
බදු අය කිරීම.
වෙළඳාම
වැරදි කරුවන්ට දඬුවම් දීම ආදියෙන් තුනක් විස්තර කිරීම.(ල. 6)

04. (i) චිත්‍ර, මූර්ති, කැටයම් (ල. 3)

(ii) A ලෙන් ලිපි
B ගිරි ලිපි
C ටැම් ලිපි
D ආසන ලිපි (ල. 4)

(iii) පැරණි ජනතාවගේ නිර්මාණශීලී හැකියාව දැන ගත හැකිවීම.
පැරණි තාක්ෂණය දැන ගත හැකිවීම.
ගොඩනැගිලි නිර්මාණය (වාස්තු විද්‍යාව) දැනගත හැකිවීම,
පැරණි ශිල්පීන්ගේ දක්ෂතා දැනගත හැකිවීම,
පැරණි ජනතාවගේ පරිසර සංරක්ෂණය දැනගත හැකිවීම. (ල. 5)

(iv) තමා ජීවත්වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය
අතීත අත්දැකීම් මගින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩනැගීම,
රටේ ජාතික අනන්‍යතාව හඳුනා ගැනීම,
අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම,
විවිධ මත ඉවසීමට පුරුදු වීම මේවා විස්තර කරන්න. (ල. 6)

05. (i) A ඉරණමඩු සැකැස්ම, B පාහියන්ගල
C පොතාන, අලිගල (ල. 3)

(ii) A ක්ෂුද්‍රශිලා මෙවලම්,
B කුරුවිට බටදොඹ ලෙන
C රංචා මඩම
D හොලෝසීන යුගය (ල. 4)

(iii) බදුල්ලට නුදුරු රාවණා ඇල්ල:-හිස් කබලේ රළුවට තිබූ දාර ගලක උලා ඔප මට්ටම් කර එක පැත්තක ගුරුගල් ආලේප කිරීම.
පාහියන්ගල ගල් ගුහාව - ගුරුගල් ආලේප කළ ශරීර කොටස් හමුවීම.
බටදොඹලෙන
ඇටසැකිලි වකුටුකර වළ දැමීම. (ල. 5)

(iv) පිලිස්සූ මැටි වළං භාවිතය,
ක්‍රමවත් සුසාන චාරිත්‍ර,
ගල් මෙවලම් වෙනුවට ලෝහ තාක්ෂණය භාවිතා කිරීම, කෘෂිකාර්මික කටයුතු ආරම්භ කිරීම, ස්ථිරවාසිකාව (ල. 6)

06. (i) කැලෑ එළි පෙහෙළි කිරීම
පොළොව කෙටීම
සී සෑම (ල. 3)

(ii) වාර්ෂික වර්ෂාපතනය
පසේ ස්වභාවය
භූ විෂමතාවය
දේශගුණය ආදිය විස්තර කිරීමට (ල. 4)

(iii) වැව මුල්කරගත් ජනාවාසඃ- සුමන වාපි විහාර වාපි, හුන්දර වාපි, කඩහවාපි, ආදි ගම් ඉදිවීම.
විවිධ කාර්යයන් පදනම් කරගත් ජනාවාසඃ- පට්ටන ගාම වරායක් මුල් කරගෙන බිහිවීම
නියම් ගම් - වෙළෙඳ ගම් බිහි වීම (ල. 5)

(iv) ගහපතිගේ කාර්යභාරයන්:- ගමක පොදු කටයුතුවලදී පවුල නියෝජනය කිරීම.
දසගම් ඇත්තන්:- බෞද්ධ විහාරවල ඇතිවෙන ගැටළු උදා:- දානය සපයා ගැනීම සම්බන්ධයෙන් ඇති වූ ගැටළු විසඳීම (ල. 6)

07. (i) A තමන් විසූ ගම
B යාබද ගම
C ඇතින් පිහිටි ගම් (ල. 3)

(ii) * ඒ ඒ ගම්වල පොදු කටයුතු වලට නායකත්වය දීම.

* ගමට අයත් වැව් නඩත්තු කිරීම.
* ඉන් ජලය බෙදා හැරීම
* ගම්වල ආරවුල් විසඳීම (ල. 4)

(iii) * ශ්‍රී මහා බෝධි රෝපන උත්සවයට කතරගම හා චන්දනගාම ක්ෂත්‍රියන්ට ආරාධනා කිරීම.
* ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛා දිවයිනේ විවිධ ප්‍රදේශවල රෝපනය කිරීමේ උත්සව පැවැත්වීම විස්තර කරන්න. (ල. 5)

(iv) * මාමාවරු සමග සටන් කර ප්‍රදේශ යටත් කිරීම.
* සිය පාලන මධ්‍යස්ථානය ලෙස අනුරාධපුරය තෝරා ගැනීම.
* දිවයිනේ ග්‍රාමසීමා ලකුණු කිරීම විස්තර කරන්න. (ල. 6)

08. (i) බෝධිසත්ත්ව සංකල්පය
නරඉසෙර සංකල්පය
පර්වතරාජ සංකල්පය
දේවත්ව සංකල්පය
චක්‍රවර්තී සංකල්පය තුනක් සඳහන් කරන්න. (ල. 3)

(ii) සහෝදරයාගෙන් සහෝදරයාට
පියාගෙන් පුතාට
රජුගේ බිසවගේ සොයුරාට
රජුගේ සොයුරියගේ පුතාට (ල. 4)

(iii) * රුවන්වැලි සෑය ඉදිකරන අවධියේ සතර දොරටුවේ දන්සැල් ඉදිකිරීම.
* සෑ රදුන්ගේ ඉදිකිරීම් කරන්නන්ට වැටුප් ගෙවීම.
*ජනතාව වෙනුවෙන් දක්වූ සහනශීලී Answer
මේවා අදාළ පරිදි විස්තර කරන්න. (ල. 5)

(iv) පළාත් බෙදා පරිපාලනය විධිමත් කිරීම.
රජයේ බදු අයකිරීම විධිමත් කිරීම
විශාල පරිමාණ වැව් ඉදිකිරීම තුළින් කලාපීය ආර්ථික ගැටළු වලට පිළියම් යෙදීම.
දේශීය ආදායම ලෙස ලැබෙන අයබදු වාරි කර්මාන්ත නඩත්තුවට යෙදවීම. (ල. 6)

09. (i) 1. වත් සිරිත් සම්බන්ධ නිලධාරි
2. භෝජනශාලා අධිකාරි
3. නගරයේ වාස්තු විද්‍යාඥයා (ල. 3)

(ii) ආගමිකඃ-
* බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය
* බෞද්ධ විහාර වල දිරූ ස්ථාන අලුත් වැඩියාව
* භික්ෂූන් වහන්සේලාට සිව්පසයෙන් උපස්ථාන කිරීම.
* විහාරාරාමවලට දීමනා ලබා දීම
* ආස්ථාන බෙදූ ප්‍රදේශවල අලුත් විහාර ඉදිකිරීම. (ල. 4)

(iii) * රෝහණ ප්‍රදේශය එක්සත් කිරීම
* රුහුණේ අභියෝග වලින් ජය ගැනීම
* සේනාව සැලසුම් සහගතව සකස් කිරීම
* මාර්ග තුනකින් සේනාව යවා පරාජය කිරීම. ආදිය විස්තර කරන්න. (ල. 5)

(iv) * ගෝකණ්ණතිත්ථ වරාය ඉන්දියානු සාගරයේ නැගෙනහිරට මුහුණලා පිහිටා තිබීම නිසා නැගෙනහිර වෙරළේ වෙළඳාමේ ප්‍රතිලාභ ලබා ගැනීමට පහසුවීම.
* නැගෙනහිර වෙරෙළේ වෙළඳාම පාලනය කිරීමට හැකි වීම.
*නැගෙනහිර සාගර කලාපයේ රටවල් සමඟ පහසුවෙන් සබඳතා පැවැත්වීමට හැකිවීම (ල. 6)